# Pawura Digital Magazine

2023 January 28 Sunday

26 Issue




නව්‍යකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කලාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine

# වැඩි වුණු








**නව වසරක් උදා වීමට අත පොවන මානයේ සිටම අපි සියළු දෙනාම ගෙවුණු වසර තුළ ඉටුකර ගත නොහැකි වූ බලාපොරොත්තු, අරමුණු සහ අභිලාසයන් එළඹෙන වසර තුළ සාක්ෂාත් කර ගැනීමට සිහින දකිනවා. ඒ වගේම නව සැලසුම් ගොඩනඟා ගන්නවා. නමුත් හා හා පුරා කියලා 2024 නව වසර උදා වීමත් සමඟම අපිට අසන්නට ලැබුණේ 2024 . 01 . 01 දින සිට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන නව බදු ප්‍රතිපත්තිය සම්බන්ධවයි.**

එම බදු ප්‍රතිපත්තිය තුළ කන බොන දේවල්, පෙට්‍රල්, ජංගම දුරකතන වගේ එකී මෙකී නොකී හැමදේම ජනවාරි මාසයේ සිට 18% ක බදු වැඩිවීමකින් මිල ඉහළ යෑමකට ලක්වීමට නියමිත බව පසුගිය දෙසැම්බරයේ සිට ම කන වැකුණත් ඒ පිළිබඳව පවුර පාඨක ඔබව වැඩිදුරටත් දැනුවත් කිරීමටයි මේ කරුණු.

බදු වැඩි වීම ආහාර ද්‍රව්‍ය , ආහාර නොවන ද්‍රව්‍ය , සෞඛ්‍ය ක්ෂේත්‍රය , කෘෂිකර්මාන්තය , කර්මාන්ත ක්ෂේත්‍රය, සේවා සැපයුම් හා වෙනත් බොහෝ ක්ෂේත්‍රයන් ඔස්සේ සිදුවීමට නියමිතයි. මේ වන විටත් ක්ෂේත්‍ර කිහිපයකම ඇතැම් භාණ්ඩ හා සේවා සඳහා බදු වැඩිකර අවසන්.

ඒ අනුව දේශීයව නිෂ්පාදනය කරන ලද පොල් කිරි, කිරි, සහල් සහ ෆාම් ඔයිල් සඳහාත් ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ධාන්‍ය වලින් සාදන ලද අධි ප්‍රෝටීන හා අධි ශක්ති කෘෂි ආහාර සඳහාත් වැඩි වන බද්ද මත මිල ඉහළ යෑමක් සිදුවෙනවා. තවද ආහාර නොවන ද්‍රව්‍ය වන ගෑස් , පෙට්‍රල් සහ ඩීසල් , ඉදිකිරීම් කර්මාන්තයට , කෘෂි කර්මාන්තයට සහ කිරි සැකසුම් සඳහා භාවිත කරනු ලබන යන්ත්‍ර , කේතකරණය යටතේ නම් කරන ලද විදුලි උපකරණ සඳහාත් මිල වැඩි වීමක් සිදුවනවා.

එසේම ජංගම දුරකථන, මෙරට නිෂ්පාදිත හෝ ආනයනය කරන ලද එතනෝල් මත ද බදු ප්‍රතිපත්තිය එලෙසම ක්‍රියාත්මක වන අතර වඩාත්ම ගැටලු සහගත වේදනාකාරී හේතුව නම්, අධි තාක්ෂණික වෛද්‍ය උපකරණ හා ගිලන් රථ මෙන්ම ආලේපන ද්‍රව්‍ය හැර ඖෂධ නිෂ්පාදනයන් හා ඇතැම් ඖෂධ වර්ග සඳහා ද මෙම බදු වැඩිවීම බැලපෑම් ඇති කිරීමයි.
හා හා පුරා කියලා උදා වූ 2024 ආරම්භයේ සිටම අපිට හිතාගන්නට වත් නොහැකි තරම් වියදමක් දරාගනිමින් ගතකිරීමට සිදුවී තිබීම කණගාටුදායක තත්වයක්. මත්ස්‍ය කාර්මික උපකරණ, දේශීය සීනි, වියළි පොල්, රබර්, රබර් කිරි, බිත්තර, දියර කිරි, තේ කොළ ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය වලත් ආනයනය කරන ලද ගවයන් , මී ගවයන්, කුකුළු මස්, ඌරන්, එළුවන් සහ බැටළුවන් සඳහාත් කෘෂි කාර්මික උපකරණ සහ වාහන සඳහාත් 18%ක බදු වැඩි වීම බලපැවැත්වෙයි.


ස්වර්ණාභරණ, මුතු, රන් කාසි, දියමන්ති සඳහාත් පොත් සහ සඟරා ආදියටත් හිම් සම්, උළු, බේකරි නිෂ්පාදන, ව්‍යාපාරික, චිත්‍රපට ඇතුළු කලා ක්ෂේත්‍රය මෙන් ම තොරතුරු තාක්ෂණ කර්මාන්තයන් සඳහාත් මෙකී බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මකයි.

වඩාත් දුක්ඛිත කරුණ නම්, ඕනෑම ආයතනයක් හෝ පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන භූමදාන හෝ ආදාහන කටයුතු සම්බන්ධ සේවාවන් සඳහාත් වැඩිවන බදු මත ගාස්තු වැඩිකර තිබීමයි. අවසන් ගමන වුව සැනසිල්ලේ යෑමට දෙවරක් සිතීමට කාලයක් උදා කරමින් 18% කින් වැඩිවන බදු සමඟ උදා වූ 2024 අභියෝගාත්මක නව වසර හුදෙක් පොදු ජනයා කබලෙන් ලිපට වැටෙන වසරක් නොවේවායි අවසන දෙවියන්ගෙන් ඉල්ලමු.

■ සටහන -
**ප්‍රබුද්ධිකා හේරත්**






# ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා නිපද වූ අපූරු ඔරලෝසුව

තාක්ෂණයේ දියුණුවත් සමඟ ලෝකය දිනෙන් දින ඉහළට යයි. පුද්ගලයන්ගේ එදිනෙදා කටයුතු පහසු කරගැනීමට තාක්ෂණික පර්යේෂණ මඟින් විවිධ වූ නිපදවීම් කරනු ලබයි. සාමාන්‍ය නිරෝගී පුද්ගලයෙකුගේ කටයුතු තවත් පහසු කරගැනීමට මෙම උපකරණ හේතු පාදක වේ.

අප සමාජයේ නිරෝගී පුද්ගලයන් මෙන් ම උපතින්ම ආබාධ සහිත පුද්ගලයන් ද වෙති. මොවුන් එම ආබාධිත තත්ත්වයන් මත සමාජයේ මුළුගැන්වීමක් බහුල වශයෙන් සිදු වේ. එම රාමුවෙන් පිටතට පැමිණෙන්නේ ඉතාමත් සුළුතරයකි. දෑස් නොපෙනෙන, කන් නොඇසෙන, අත් පා අහිමි පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය සාමාන්‍යකරණය කිරීමට තාක්ෂණය මඟින් අද වන විට විවිධ අත්හදාබැලීම් සිදුකරනු ලබයි. දෑත් දෙපා අහිමි වූවන්ට කෘතිම දෑත් දෙපා ඉතාමත්ම ස්වභාවික අයුරින් නිර්මාණය කිරීමට තරම් දියුණු තාක්ෂණයක් ලොව පුරා අද වන විට නිර්මාණය වී පවතී.

එලෙස ශ්‍රවණාබාධිත පුද්ගලයන් උදෙසා පහසුවක් වන පරිදි නිපද වූ ස්මාර්ට් ඔරලෝසුවක් පිළිබඳව තොරතුරු ඇමෙරිකාවෙන් වාර්තා වේ.





පරිසරයේ ඇතිවන ශබ්ද සංවේදනය කිරීමට, වර්ගීකරණය කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට හැකි වන පරිදි මෙම ස්මාර්ට් ඔරලෝසුව පදනම් වූ යෙදවුම නිර්මාණය කර ඇත. SoundWatch නමින් හඳුන්වන මෙම ඔරලෝසුව නිපදවා තිබෙන්නේ ඇමෙරිකාවේ වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ Dhruv Jain මහතා ප්‍රමුඛ නිෂ්පාදන කණ්ඩායම විසිනි.

නවීන Android පාදක යෙදුම් හා මෘදුකාංග භාවිත කරමින් මෙම ඔරලෝසුව නිපදවා ඇත. ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන්ට බාහිර ලෝකය හා එක්වරම සම්බන්ධ වී ශබ්ද හොඳින් හඳුනා ගැනීමට හා ඒවාට නිවැරදිව ප්‍රතිචාර දැක්වීමට මෙමඟින් හැකියාව ලැබේ. ස්මාර්ට් ජංගම දුරකථනය හා සම්බන්ධ මෙම ඔරලෝසුව පැළඳ සිටීමෙන් බාහිර පරිසරයෙන් ඇසෙන ශබ්ද වෙන්කර හඳුනාගෙන ස්මාර්ට් දුරකථනයේ දර්ශන තිරයට ලබා දීමක් සිදු වේ. ඒ අනුව එහිදී මෙම යෙදවුම ඔස්සේ ස්මාර්ට් ජංගම දුරකතනයේ ඇති ශ්‍රවණ පහසු කිරීමේ යෙදවුම් ක්‍රියාත්මක කිරීම මඟින් ඔරලෝසුව ඇති යෙදවුම ක්‍රියාත්මක කරයි.

බාහිර පරිසරයෙන් ඇසෙන ශබ්ද වලින් 97.6%ක්ම ශබ්ද නිවැරදිව හඳුනාගෙන ඒ පිළිබඳව සටහන් දුරකථන තිරයට ලැබීම හා ස්පීකරයෙන් ඇසීමට අවස්ථාව මෙම ඔරලෝසුව මඟින් ලබා දී ඇත.

■ සටහන
**W. නිලුක්ෂි කුමාරි**
කැලණිය විශ්වවිද්‍යාලය




දිනෙන් දින කාන්තාවන් සහ පාසල් දැරියන් පිළිබඳව අමිහිරි පුවත් අසන්නට ලැබේ. ළමා හා කාන්තා අපයෝජනය වැළැක්වීමේ කොට්ඨාසය සඳහන් කර ඇති පරිදි සැප්තැම්බර් මාසයේ වයස 16 අඩු ගැහැණු ළමයින් 194 ක් අපයෝජනයට ලක්ව ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වන කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනය සිදු වන ප්‍රධාන සමාජ ස්ථානයක් ලෙස පොදු ප්‍රවාහන බස් රථ හා දුම්රිය වී ඇත.




# මම සෙරෙප්පුව අතට ගන්නද? නැත්නම් ඊළඟ හෝල්ට් එකෙන් බැහැල යනවද?"

ශ්‍රී ලංකාවේ බස් රථ හා දුම්රිය වැනි පොදු ප්‍රවාහන සේවා භාවිත කරන කාන්තාවන්ගෙන් 90%ක් එම ප්‍රවාහන මාධ්‍ය ඇසුරේදී ලිංගික හිංසනයට ලක්වන බව එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් 2017 වසරේ නිකුත් කරන ලද වාර්තාවක සඳහන් වේ. මේ අතරින් වඩාත් පීඩාවට පත්ව ඇත්තේ රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා පොදු ප්‍රවාහන සේවය භාවිත කරන කාන්තාවන්ය. නමුත් ඒ සම්බන්ධයෙන් පොලිස් රැකවරණය පතන්නේ අදාළ කාන්තාවන් අතුරෙන් 4%ක පමණ පිරිසක් බව පොලිස් ළමා සහ කාන්තා කාර්යාංශයේ දත්ත අනුව පෙනී යයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තිය අනුව "කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය" යනුවෙන් සඳහන් වන අතර වසර 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධන පනතේ 345 කොටස අනුව ද ලිංගික හිංසනය යනු දඬුවම් ලැබිය හැකි සාපරාධී වරදකි. මෙම කොටස අනුව ලිංගික හිංසනය යටතට ලිංගික ස්වරූපී පහරදීම්, සාපරාධී බලය යෙදවීම, හිංසනයට ලක්වන පුද්ගලයා කුපිත කිරීමට හේතුවන වචන හෝ ක්‍රියා අයත් වන බවද සඳහන් වේ. එහෙත් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් කරනු ලැබූ සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 52%ක් ලිංගික හිංසනය අපරාධයක් ලෙස සැලකෙන නීතියක් තිබෙන බව දැන සිට ඇති නමුත් 60%ක් දෙනා ලිංගික හිංසන වරදට දඬුවමක් තිබෙන බව දැන සිට නැත.

මෙම වරදට එරෙහිවීම සඳහා ඔබ අයිතියක් ඇත. එවන් අවස්ථාවකදී පොලිස් ක්ෂණික දුරකථන අංක 119, කාන්තා උපකාරක දුරකථන අංක 1938 හෝ ජාතික ගමනාගමන මණ්ඩලයේ ක්ෂණික දුරකථන අංක 1955 වෙත දැනුම් දිය හැකිය. බස් රථයක් තුළ මෙවැනි හිංසනයක් සිදුවෙන බව දැනුනහොත් එය තමන්ට නොවුනත් වෙන කෙනෙකුට සිදුවුවත් ඇයට කතා කිරීමට සහයෝගයක් වෙන්න අමතක කරන්න නොකරන්න. එසේ නොමැති නම් එය ඔවුන්ගේ අධ්‍යාපනයට, රැකියාවන්ට හා පෞද්ගලික ජීවිතවලට අහිතකර වේ. එහි ප්‍රතිඵලය මුළු රටට ම බලපායි.

නිදසුනක් ලෙස,
කාන්තාවන් ශ්‍රම බලකාය සමඟ සම්බන්ධ වීමට එය බාධාවකි. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් ශ්‍රම බලකාය සමඟ සම්බන්ධ වන්නේ අඩු ප්‍රමාණයකි. සුරක්ෂිත පොදු ප්‍රවාහනය කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට අතිශය වැදගත් ය. ලිංගික හිංසනයන්ට බිය නොවී පොදු ප්‍රවාහන සේවා පාවිච්චි කිරීමේ නිදහස ඔවුන්ට තිබිය යුතු ය.

■ සටහන -
**නිරෝෂා සදමාලී**
කැලණිය විශ්වවිද්‍යාලය

# විශ්වයේ සදාතනික ආදර අන්දරය

## ෂේක්ෂ්පියර්ගේ රෝමියෝ ජුලියට්







**ප්‍රේමණීය හදවත් ආදරයෙන් මුසපත්වන මාසයක ආදරයේ රහ, විරහ සුන්දරව විඳින්නට ඔබ වෙනුවෙන්ම පිරිනැමෙන සදාතනික ආදරයේ නොමියන ප්‍රේමවෘතාන්තය "රෝමියෝ ජුලියට්" වේදිකා නාට්‍යය පිළිබඳ එහි අධ්‍යක්ෂක ජයනාත් බණ්ඩාර මහතා සමඟ සිදු කළ කතාබහයි මේ.**



**01 ඔබතුමාගේ අදහස අනුව මොකක්ද මේ වේදිකා නාට්‍යයක් කියල කියන්නේ ?**

අනෙක් ප්‍රාසාංගික කලා අතරින් වේදිකා නාට්‍ය වෙන්කර ගත්විට එහි ඇති සුවිශේෂීම කාරණාව වන්නේ සජීවී බවයි. ප්‍රේක්ෂකයාට සජීවී අත්දැකීමක් වේදිකා නාට්‍ය තුළින් අත්විඳීමට හැකියාවක් තිබෙනවා. ඒ මොහොතේදීම ශිල්පීය හඬ, මනෝභාව මෙන්ම සංගීතය , ආලෝකය වැනි දේවල් නිරූපණය කිරීමත් මෙහි විශේෂත්වයක්. එසේම එකම කලා කෘතියක් වුවත් නැවත නැවත නැරඹීමෙන් ප්‍රේක්ෂකයන්ට ලැබෙන්නේ වෙනස් වූ අත්දැකීම් රැසක්. සරලවම ගතහොත් වේදිකා නාට්‍යයක් කියල කියන්නෙ ගලාගෙන යන වතුර පහරක් වගේ.

**02 වේදිකා නාට්‍යය අතරින් රෝමියෝ ජුලියට් නාට්‍යය විශේෂ වන්නේ ඇයි ?**

"රෝමියෝ සහ ජුලියට්"නාට්‍යය ෂේක්ස්පියර්ගේ සෙසු නාට්‍යයන් අතරින් සාපේක්ෂව සරල නාට්‍යයක් බව එය කියවන්නෙකුට හෝ එහි නිෂ්පාදනයක් නරඹන කෙනෙකුට පහසුවෙන් නිර්ණය කරන්න පුලුවන්. එහෙත් නාට්‍යයේ ගලායාම හා ගැටුම වර්ධනය වන ආකාරය ඉතා ආකර්ෂණීය ලෙස වින්‍යාස ගතකර තිබෙනවා. එහි ඇත්තේ සූක්ෂම ලෙස නිමවන ලද නිරායාස ගුණයක්. ආදරය සම්බන්ධයෙන් එහි ඇති අර්ථකථන, යෙදුම් ලෝක ඉතිහාසයේ ආදරය සම්බන්ධයෙන් ලිය වී ඇති කෘති අතරේ ප්‍රමුඛස්ථානයක් ගනු ලබනවා. එම නිර්මාණය ඉක්මවා යන වෙනත් කෘතියක් පෙන්වා දීමද කෙනෙකුට ඉතා අපහසුයි. මෙම නාට්‍ය තුළින් සදාතනික ආදර කතාවක් නිරූපණය කර තිබෙනවා. මෙහි අවසානයේදී මොවුන්ගේ ආදරයට කුමක් සිදුවුණේ ද ? මෙහි ඇති සාහිත්‍ය සහ දේශපාලන කියවීම කුමක්ද? යන්න නාට්‍ය කියවන්නන් සහ රසවිඳින්නන් හොඳින්ම දැන ගත යුතු කාරණාවක්. අපි හැමෝම දන්නවා අවසානයේදී රෝමියෝ සහ ජුලියට් මේ දෙදෙනාම මරණයට පත්වන බව. නමුත් මොවුන් මිය යන්නේ ආදරයෙන් පරාජය වී නොව ආදරය ජය ගෙනයි. මේ නාට්‍ය තුළින් ආදරවන්තයින් සහ ආදරවන්තියන්ට ආදරය සුන්දරව විඳින්නේ කොහොමද? ආදරයේදී ඇති වන ගැටලු , බාධකවලට ශක්තිමත්ව මුහුණ දෙන්නේ කොහොමද කියන එක ගැන ලොකු පණිවිඩයක් ලබාදෙනවා.



ජයනාත් බණ්ඩාර

**03 මෙය වේදිකා නාට්‍යයක් ලෙස සංස්කරණය කිරීමේදී එහි අන්තර්ගතයට වෙනසක් සිදු කළාද?**

ඔව්, ඇත්තටම මෙය දීර්ඝ පිටපතක් සහිත නිර්මාණයක්. වේදිකාව මත අපිට මෙම නිර්මාණය රඟදැක්වීමට නම් එය සංස්කරණය කිරීම අත්‍යවශ්‍යම කාරණාවක් වුණා. මොකද වැඩි කාලයක් අපි වේදිකව මත රැඳී සිටීම, එය නරඹන ප්‍රේක්ෂකයාට යම් අපහසුතාවයක් ලෙස අපි දකිනවා. ඒ නිසා මෙහි මූලික සන්දර්භයට හානියක්



නොවන ලෙස යම් යම් සංස්කරණයන් සිදු කරන්නට වුණා. එක් දර්ශන වාරයක් සඳහා පැය එක හමාරක් පමණ කාලයකට සීමාවන්නට මෙහි පිටපත සංස්කරණය කිරීමට සිදු වුණා.

**04 වේදිකා නාට්‍යයකට රංගන ශිල්පීන් තෝරාගැනීම සහ ඔවුන් සමඟ වැඩ කිරීම තරමක් අභියෝගාත්මකයි. එහෙම නේද?**

මෙම නිර්මාණය සඳහා ශිල්පීන් විසි අටදෙනෙක් පමණ දායකත්වය දක්වා තිබෙනවා.

වේදිකා නාට්‍ය අධ්‍යක්ෂකවරයෙක් ලෙස මේ සියලු ශිල්පීන් හා කටයුතු කිරීම ඇත්තටම විශාල අභියෝගයක්. ඒ නිසා මම චරිත තෝරා ගැනීමේදී ඔවුන්ගේ රංගන හැකියාව මෙන්ම රංගන දැනුම පිළිබඳව සහ සුහදත්වය යන කාරණා අධ්‍යයනයකින් පසුව ඔවුන් තෝරා ගැනීම සිදු කළා.



**05 රෝමියෝ ජුලියට් නාට්‍යය ප්‍රේක්ෂකයන්ට නරඹන්නට හැකිවන්නේ කවදාද? කොහේදීද?**

රෝමියෝ ජුලියට් නාට්‍යය 2024 පෙබරවාරි මස 14 (බදාදා) වන දින එනම් ආදරවන්තයන්ගේ දිනයේදී "ලයනල් වෙන්ට් රඟහලේදී , දර්ශන වාර දෙකක් (සවස 3.30 සහ 6.30) සහිතව වේදිකාගත කිරීමට අපි සියලුම කටයුතු සූදානම් කර හමාරයි. ප්‍රවේශ පත්‍ර එදින දොරටුවෙන් ලබා ගැනීමට හැකියාව ඇති අතර සවස 3.30 දර්ශන වාරයට පාසල් ළමුන්, ගුරුවරුන් සහ විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් සඳහා විශේෂ වූ මිල අඩු කිරීමක් සහිතව ප්‍රවේශ පත්‍ර නිකුත් කෙරේ.






**06 මෙම නාට්‍යය වේදිකාවට ගෙන ඒමේදී මුහුණදුන් අභියෝග මොනවාද?**

ඇත්තටම මේ නාට්‍යය තුළදී අපට අභියෝග රාශියකට මුහුණ දෙන්නට සිදු වුණා. වේදිකා නාට්‍යයක් රඟදැක්වීමට නම් දිගු කාලීන පුහුණුවක් අත්‍යවශ්‍යයයි. අපි මේ දක්වා මාස හතක පමණ කාලයක් පුරාවට පුහුණුවීම් සිදු කරල තිබෙනවා.





පුහුණුවීම් සිදු කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැති වීම නිසා අපහසුතා රැසක් අපට ඇති වුණා.

ඒ වගේම, ආර්ථික වශයෙන් ලොකු ගැටලුකාරී තත්වයක සිටින අවස්ථාවක ආර්ථිකමය ගැටලු රාශියකට මුහුණ දෙන්න සිදු වුණා. ගොඩක් දෙනෙකුගේ මතයක් තිබෙනවා වේදිකා නාට්‍යය කියන්නෙ ලාභ ලැබිය නොහැකි කලාවක් බව. නමුත් එය නිවැරදි කාරණාවක් නොවේ. මේ හේතුව නිසා සම්පත්දායකයන් ඉදිරිපත් වීමේ යම් අඩුවක් පවතිනවා. වේදිකා නාට්‍යය ලාභ ලැබිය හැකි කලාවක් ලෙසයි මම දකින්නෙ. මේ කලාවට ආදරය කරන, යම් පිරිසක් තවමත් සිටින නිසයි කෙසේ හෝ සියලු බාධක, අභියෝග ජය ගනිමින් මේ නාට්‍යය පෙබරවාරි 14 දින වේදිකාගත කරන්නේ.

අවසන් වශයෙන්, සදාතනික ආදර කතාවක රසය විඳින්නට එදින රඟහලට පැමිණෙන්න, රඟහලේ කොටස්කරුවෙකු වෙන්න. සජීවී කලාවක සජීවී බව අත්විඳින්න ආදරයෙන් ආරාධනා කරනවා ඔබ සියලු දෙනාටම.

■ සටහන -
**එච්.එම්. දිල්හාරා බණ්ඩාර**
කැලණිය විශ්වවිද්‍යාලය

# කැටපත් පවුර

සිතුවිලිලට පන්හිඳෙන් ජීවය දෙන කැටපත් පවුර

## ප්‍රේමය...

අහම්බෙන් වුව
ජීවිතේ අතරමඟ හමුවෙච්ච
ඒ ආදරණීයම ආත්මයට
ලියමි

නොදනිමි මා
දෝතින්ම තුරුළු කර
ළඟ තබාගත හැකිවේවිද නුඹව

ළයෙහි හිස හොවා
සැනසෙන්න හිනැහෙන්න
නිමේෂයක් හෝ ලැබේවිද අපට

නමුත් නුඹ වෙනුවෙන්ම
හදවතේ පතුලේම
නිදන් කල ප්‍රේමය සදාකාලිකය

ඉදින් හිතවත,

ක්ෂිතිජ කෙළවර
වලාකුළු මත පාවෙන
සුසුම් පොදක්වී හෝ
යලි මුණගැසේවා.....

■ ප්‍රබුද්ධිකා හේරත් ( පබා )



## ලියා තබමි

මිලාන වී ගිය
මල් පෙත්තක අග
ලියා තබමින්
එකම එක කවි පෙලක්
ක්ලේම භූමියක
ඉතිරි වී ගිය
වැලි කුණාටුවක
තවරමි
එකම එක කතාවක්
වසන්තේ අග
නිමා නොවූ
පන්හිඳක ලියමින්
එකම එක පෙම් කවක්
මෙලෙස
සුබ පතන්නම්
කටෝර වූ අනියත වූ
ගැහෙන හද ගැඹුරට
දැනුනනම්
එක පෙමක්
එයත් හරි ලස්සන කතාවක්

■ ඩිනූ සල්ගමුවගේ



## ආසම මල නුඹ

මතක හෙම්බත් පපුව ගැඹුරට....
නුඹ හැරෙන්නට කොයිද සිසිලක්....
කොළ පිරෙනකල් කවි ලියුවත්....
දැනෙන්නෙද ඒ ගැන වගක්වත්....
බලා ඉද්දිම නෙළන් යනකොට....
කටු ඇනුනා මට මහ ගොඩක්....
දළුලාපු මගෙ හිත් උයනෙ පිපි....
ආස මල නුඹ තමයි තාමත්....

■ පී.ඩී.මල්ෂා සම්මානී

## මතක

ඇත්කඳ වෙහෙර වඳින
ඇත්කඳ ලිහිණි රෑන
අද මට ලස්සන කතාවක් කිව්වා
ඇතුගල වගේ නොසෙල්වෙන ඒ ආදරේ
රන්තාලිය වැවේ පතුළෙම
අද ඔයා හැංගුවලු
වැවේ රැළි වෙනදා ඔයා එක්ක එකතු
වෙලා මට බැන්නලු ඔයාව තනියම
එව්වා කියලා
අද ඔයා ඈතින් එනවා දකිද්දී රැළි හරි
ලස්සනට හිනා වුණාලු ගොඩාක් සතුටින්
වෙනදා වගේම යාළු වෙලා අපි දෙන්නා
ආයේ එනවා කියලා
ඒත් නුහුරුයිලු නුපුරුදුයිලු.
හිතුවලු මං වෙනස් වෙලා කියලා
ඒත් පුංචි හිරි පොද වැස්සක් එක්ක
අහසින් පණිවිඩයක් එවලා
ඒ මම නෙවෙයි වෙන කෙනෙක් කියලා
කුරුණෑගල අහසට ඒක
දරාගන්න බැරි වුනාලු
ඉතිං අහසත් අද හඬනවාලු...
ඒ අහසේ කඳුළු එක්ක
අපේ මතක හේදිලා ගියාලු
ඔයාලගේ මතක පොතක් දිගහැරුණාලු
මගෙ හිත ගිනිවැදුනද කියලා ඇත්කඳ
ලිහිණියා අහද්දී මම කිව්වේ....
"ඒක...
මේ දැන් පිච්චිලා අළු වුණා"
කියලා
ඉතිං වෙහෙර මළුවෙ මං
මොකට හඬන්නද
ඔයා සතුටින්නම්

■ සවී

## එකම පුතා

ලොකු හාමුදුරුවෝ ගාවින් ඉඳගෙන බණ පද ටික ටික මුමුනන්න
පුතුහට ආසලු පන්සල ඇතුළෙම සිවුරක් දවටන් සැනසෙන්න
අම්මට කිව්වම එකම පුතා කොට බෑ මේ මට නම් දන් දෙන්න
අඬ අඬ කිව්වා අද වගේ මතකයි හදවත පැත්තක් ගිනි ගත්ත

තාත්තා කැමතිද පුතු මට දෙන්නට ලොකු හාමුදුරුවෝ විමසුව
හතර වරිගයම එතෙර කරන්නට  කැමැති වුණා අකමැත්තෙන්ම
තිසරණේ  පිහිටා පුතු පොඩි සාදුට කහ සිවුරක් ඇඟ දැවටුව
එතැන් පටන් නුඹ පුන් සඳ විලසින් පන්සල් දෙවොලේ වැජඹුන

පිය පුතු සෙනෙහෙට ලේ නෑකම් නැත මගේම පුතු යැයි සැලකුව
කැස්සක් හැදුණත් වෙනිවැල් තම්බා උගුර උගුර පෙව්වා මතක
සෙල්ලම් කරලා යාලුවෝ එක්කල ගල් මුල් ඇනගෙන පා දෙකෙම
ඉකි ගහ ඇඬුවම තුරුලට නුඹ ගෙන හිස පිරිමැද සැනසූ හැටි මතක

නින්දට ගිය පසු හොරැහින් ඇවිදින් නුඹ දෙස බලමින් හෙමින් සැරෙන්
කරනා දඟ වැඩ හාන්සී පුටුවට වැටුණම සිහිකරවයි මනසින්
සීගිරි යන්නට පුංචි දෙපා වල සවියක් ඇද්දැයි මා ඇසුවොත්
ලොකු හාමුදුරුවෝ මම දැන් ලොකුයිනේ කියයි සිනහවක් මුසු මුහුණින්

සසර බැඳීම් දුක් කෙළවර කෙරුමට පුත මේ භවයත් මදි වූවොත්
වෙන්නම් මා මව් පිය යන දෙපළම මතු භවයේදීත් මේ විලසින්
සිතට සවිය ගෙන නුඹ කර මතටම ගන්නම් ආදර කරුණාවෙන්
දෙපා රිදෙන් නෑ ඉවසන් මා පුත අවසන් පඩියත් බැහැ ගද්දින්



■ එම්.ජී තාරිකා මධුශානි



# චතුරාර්ය සත්‍ය තුළින් පෙරට ආ බෞද්ධ දර්ශනය

**සිද්ධාර්ථ ගෞතම තාපසයන් වහන්සේ ස්වකීය සත්‍ය ගවේෂණ පර්යේෂණයේදී පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරගැනීමෙන් චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගත්හ. ප්‍රතිත්‍ය සමුප්පාදයට අනුව සත්ත්වයා හා සම්බන්ධ සංසාර ගමනෙහි ඉපදීම, පැවතීම, මරණයට පත් වීම සහ එය නැති කිරීමේ උපාය මාර්ග කුමක්ද යන්න සොයා බැලීමේදී, විමසීමේදී, ගවේෂණය කිරීමේදී පටිච්ච සමුප්පාදය හා සම්බන්ධ හේතු ප්‍රත්‍ය ධර්ම තුළින් ඇතිවන ජාතිය හෙවත් ඉපදීම සංසාරික දුක්ඛයට හේතු වන බැවින් එම දුක, දුක ඇතිවීමේ හේතුව, දුක නැති කළ යුතු බව, දුක නැති කිරීමෙන් ලබන ඵලය කුමක්ද යන කාරණා විමර්ශනයට ලක් කිරීමෙන් ප්‍රතිත්‍ය සමුප්පාදයෙන් ජනිත කරන ජාතිය හෙවත් ඉපදීම දුක වශයෙන් උන්වහන්සේ අවබෝධ කර ගත්හ. එසේම ඒ දුක ඇති වීමට හේතුව කුමක් දැයි සොයා බැලූ උන්වහන්සේට දුක ඇති වීමට හේතුව ප්‍රතිත්‍ය සමුප්පාදය හා සම්බන්ධ තෘෂ්ණාව බව (දුක්ඛ සමුදය) අවබෝධ විය. ඉන් පසුව උන්වහන්සේ විමසීමට ලක් කළෝ දුක නැති කිරීම (දුක්ඛ නිරෝධය) පිළිබඳවය. අනතුරුව උන්වහන්සේ දුක්ඛ නිරෝධයට මාර්ගයක් (දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව) තිබේදැයි සොයා බැලූහ.**

**ඒ අනුව උන්වහන්සේ පටිච්ච සමුප්පාද සංඛ්‍යාත ඉපදීම දුක යයි දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කර** ගත්හ. අනතුරුව ඒ දුක ඇති වීමට හේතුව සෙවූ උන්වහන්සේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය දුක් කඳ ඇතිවීමට හේතුව බව පැහැදිලි කර ගත්හ. දුක නැති කිරීමෙන් ඇතිවන ඵලය කුමක්ද යන්න විමසා බැලූ උන්වහන්සේට දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය අවබෝධ කර ගැනීමට හැකි විය. දුක්ඛ නිරෝධය සඳහා කාරණා සොයා බැලූ උන්වහන්සේව ඒ සඳහා දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍යය හේතු වන බව පෙනී ගියේය.

ඒ අනුව සිද්ධාර්ථ ගෞතම තාපසයන් වහන්සේ ස්වකීය සාවුරුදු පර්යේෂණ සමයේදී මිනිසාගේ ඉපදීම, පැවැත්ම හා නැවත්ම පිළිබඳව වූ සංසාරික හේතු ඵල සහ නිබ්බාණික හේතු හෙවත් සත්ව සන්තතියේ නැවත්ම පිළිබඳ මූලික හේතු සාධක අවබෝධ කොට සත්ව ලෝකය, සංස්කාර ලෝකය සහ අවකාශ ලෝකය පිළිබඳ වූ සියල්ල දන්නා තත්වයට හෙවත් සර්වඥ බවට පත් වූහ, හෙවත් සර්වඥතා ඥාණය ලබා ගත්හ. සංසාරය සඳහා පවතින්නේ නිබ්බාණික හේතුඵලය. සංසාරික හේතුඵල යනු සත්ත්වයා සසර ගමන් කර වන හේතුව සහ ඔහු ලබා ගන්නා ඵලය කුමක්ද යන්න දැක්වීමය.

එයින් සංසාරික හේතුව වන්නේ සමුදය සත්‍යය හෙවත් තෘෂ්ණාවයි. එයින් ලබන සංසාරික ඵලය වන්නේ දුක්ඛ සත්‍යයයි.

නිබ්බාණික හේතුව වන්නේ මාර්ග සත්‍යයයි. නිබ්බාණික ඵලය වන්නේ නිරෝධ සත්‍යයයි. මාර්ග සත්‍යය යනු මධ්‍යම ප්‍රතිපදාව පදනම් කරගත්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති හා සම්මා සමාධි යන ආර්ය අෂ්ඨාංගික (යහපත් දැකීම, වැටහීම, වචනය, ක්‍රියාව, දිවිපැවැත්ම, උත්සහය, සිහිය හා අරමුණ හෙවත් වැඩේට යොමු වූ එකඟ සිත) මාර්ගයයි. නිරෝධ සත්‍ය යනු නිර්වාණයයි. සකලවිධ කෙළෙස් ක්ෂය කිරීමෙන් හෙවත් නැති කිරීමෙන් ප්‍රතිත්‍ය සමුප්පාදය ජයගෙන, නැවත පංචස්කන්ධය වශයෙන් එන උපත හෙවත් හට ගැනීම ක්ෂය කිරීමෙන් ලබන අවේදිත සැපයයි.

බුදු සමයෙහි හා බෞද්ධ දර්ශනයෙහි දර්ශනික හරය වන්නේ යථා භූත ඥාණ දර්ශනයයි. චතුරාර්ය සත්‍යාවබෝධය එම යථා භූත ඥාණ දර්ශනයයි. එම යථා භූත ඥාණ දර්ශනයෙන් බුදුන් වහන්සේ අවබෝධ කරගෙන ප්‍රකාශ කළෝ සත්ත්වයාගේ උපත හා පැවැත්ම හා සම්බන්ධ පටිච්ච සමුප්පාද දර්ශනය පැහැදිලි කිරීම සහ සත්ත්වයාගේ නැවත්ම සංඛ්‍යාත නිවනට පැමිණීම පිළිබඳව කාරණා ගෙන හැර දැක්වීමය.


■ සටහන -
**එස්. රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්**
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය



# තමන්ගෙම කියලා ව්‍යාපාරයක් කරන්න කැමතිද ?

**ව්‍යාපාර විවිධ පදනම ඔස්සේ වර්ග කර දැක්විය හැකි අතර එලෙස වර්ග කළ හැකි එක් පදනමක් වනුයේ ව්‍යාපාරවල ප්‍රමාණය අනුව වර්ග කිරීමයි. එම පදනම මත ව්‍යාපාර කොටස් තුනකට බෙදා දැක්විය හැක.**

- **කුඩා පරිමාණයේ ව්‍යාපාර**
- **මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර**
- **මහා පරිමාණයේ ව්‍යාපාර**

වශයෙනි .

මෙම ව්‍යාපාර අතරින් ශ්‍රී ලංකාව වැනි රටක බහුලව දැකගත හැකි ව්‍යාපාර වර්ගය වනුයේ කුඩා පරිමාණ ව්‍යාපාර වේ. මෙය ඕනෑම රටක පොදු තත්වයක් වන අතර කුඩා පරිමාණ ව්‍යාපාර ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් අනුගමනය කරනු ලබයි. පෞද්ගලික හිමිකාරත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන කුඩා සේවක සංඛ්‍යාවක් සහ අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර ‘කුඩා පරිමාණ ව්‍යාපාර’ වන අතර ශ්‍රී ලංකා වැනි රටක විරැකියාවෙන් පෙළෙන ජනයාට හා නිවසට වී සිටින ගෘහණියට පහසුවෙන් සිදුකළ හැකි මෙන් ම අඩු ආයෝජනයකින් වැඩි ලාභ ලබාගත හැකි කුඩා පරිමාණ ව්‍යාපාර පිළිබඳව අපි විමසා බලමු.

- **විසිතුරු මසුන් ඇති කිරීම සහ අලෙවි කිරීම.**

ලංකාවේ රැකියා අවස්ථා නිර්මාණය කළ හැකි මෙන් ම උපරිම ලාභ ලැබිය හැකි ව්‍යාපාරයක් ලෙස විසිතුරු මසුන් අලෙවි කිරීම පෙන්වාදිය හැකිය. මෙය කුඩා පරිමාණයේ ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ ද ලාභ ඉපයීමෙන් මහා පරිමාණයේ ව්‍යාපාරයක් දක්වා වර්ධනය කරගත හැකි සුවිශේෂී ව්‍යාපාරයක් වේ .

- **කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය**

කාබනික එළවළු සහ පලතුරු වගාව සඳහා කොම්පෝස්ට් පොහොර බහුලව යොදා ගන්නා අතර ලංකාවේ දැනට වගාවන් සඳහා දැඩි ඉල්ලුමක් පවතින අතරම නිවසේ සිට පහසුවෙන් පවත්වාගෙන යා හැකි ව්‍යාපාරයක් ලෙස මේ දැක්විය හැකිය.

- **මල් අලෙවි සැලක් ආරම්භ කිරීම**

නිවසේදීම ආරම්භ කර පවත්වාගෙන යා හැකි උපරිම ලාභ ලැබිය හැකි ව්‍යාපාරයකි. ඇන්තූරියා, ඕකිඩ් වැනි මල් වර්ග වලට දැඩි ඉල්ලුමක් පවතින හෙයින් මල් වගාවට ප්‍රිය ගෘහණියන්ට මානසික සුවයක්ද ලබා ගනිමින් උපරිම ලාභ ලැබිය හැකි අවස්ථාවක් ලෙස මෙම ව්‍යාපාරය ද දැක්විය හැක.

- **රසකැවිලි ආශ්‍රිත ව්‍යාපාර ආරම්භ කිරීම.**

එදිනෙදා පවතින විවිධ උත්සව අවස්ථා සඳහා රසකැවිලි ආශ්‍රිත නිෂ්පාදන අවශ්‍ය වන බැවින් නිවෙසේ සිට ආරම්භ කොට ලාභ ලැබිය හැකි ව්‍යාපාරයක් ලෙස රස කැවිලි ව්‍යාපාර දැක්විය හැකිය. කැවුම්, කොකිස් ,අලුවා ,කිරි ටොෆි ආදී රස කැවිලි පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය අනුව සකසමින් ගුණාත්මක භාවය මත ඉහළ ආදායමකට යා හැකි සුවිශේෂී ව්‍යාපාරයක් වේ.

- **කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන.**

මිරිස්කුඩු, කහකුඩු තුනපහකුඩු කුරුදුපොතු වැනි මුලුතැන්ගේ ආහාර පිස ගැනීම සඳහා අවශ්‍යවන මෙන් ම රසවත් කර ගැනීම සඳහා අවශ්‍යවන මෙම කුළුබඩු ඉතා ගුණාත්මක බවින් සෞඛ්‍යාරක්ෂිතව සහ පිරිසිදුව නිෂ්පාදනය කිරීම තුළින් ඉතා ඉහළ ආදායමකට යා හැකි ව්‍යාපාරයක් ලෙස දැක්විය හැක.

මේ අනුව නිවසට වී සිටින ඔබට පහසුවෙන් නිවසේ සිට ම සිදු කළ හැකි කුඩා පරිමාණ ව්‍යාපාර අවස්ථාවන් ලෙස ලෙස ඉහත දැක්වූ ව්‍යාපාර අවස්ථාවන් පෙන්වාදිය හැකි අතරම එතුළින් විරැකියාව සහ ජීවන වියදමට තිත තැබිය හැකි කදිම අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකිය.


- සටහන -

**වින්ද්‍යා රත්නායක**

කැලණිය විශ්වවිද්‍යාලය

## පුංචි ව්‍යාපාරයක් ආරම්භ කරන්න බලාගෙන ඉන්න හැමෝටම

# ව්‍යාපාරය සාර්ථක කරගැනීමට මගක්



**පුංචි ව්‍යාපාරයක් ආරම්භ කරන්න බලාගෙන ඉන්න ඔබ ඔබේ ව්‍යාපාරය සාර්ථක කරගැනීමට නම් පහත කරුණු පිළිබඳව සැළකිලිමත් විය යුතුය.**

### 01 ව්‍යාපාරය සඳහා ඔබට කෙතරම් කැපවිය හැකිද ?

ඔබ ව්‍යාපාරිකයෙක් වීමට සිහින දකින්නේ නම් ඒ සඳහා ඔබ යම්කිසි ආකාරයක කැපවීමක් සිදු කළ යුතුය. එනම්, අමුද්‍රව්‍ය සොයා ගැනීමට, මුදල් සපයා ගැනීම හා පාලනය, නිෂ්පාදන කටයුතු, සේවකයන් සොයා ගැනීම හා මෙහෙයවීම, යන්ත්‍රෝපකරණ සපයා ගැනීම හා නඩත්තුව  මෙවැනි කටයුතු සඳහා ඔබගේ කාලය , ශ්‍රමය පූර්ණ ලෙස වැය කිරීම සිදු කළ යුතුයි. තමා සතුව පවතින කළමනාකරණය මඟින් ව්‍යාපාරය සාර්ථක කරගැනීමට හැකියාව ව්‍යාපාරිකයාට පැවතිය යුතුය.

### 02 ඉලක්කගත පාරිභෝගිකයා කවුද ?

ව්‍යාපාරය මඟින් ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව ඉදිරිපත් කරන්නේ කිනම් පාරිභෝගික කාණ්ඩයක් සඳහා ද යන්න තීරණය කිරීම වැදගත් කරුණකි. එනම් දැනටමත් එම භාණ්ඩය හා සේවාව ලබා ගන්නා පිරිස හෝ ඉදිරියට එම භාණ්ඩ හා සේවාව ලබා ගැනීමට පැමිණෙන පිරිසගේ රුචි අරුචිය හඳුනා ගැනීම සිදු විය යුතුයි. එනම්, ළමුන් අපේක්ෂා කරන ආකාරයෙන් වැඩිහිටියන් අපේක්ෂා නොකරයි. එමෙන්ම අඩු ආදායම්ලාභී පිරිසට මෙන්ම වැඩි ආදායම්ලාභී පිරිසට යන දෙපාර්ශවයටම සාධාරණ ලෙස මිලදී ගත හැකි භාණ්ඩ හා සේවාවන් ලබා දිය යුතුය.

### 03 වර්තමාන වෙළඳ පොල තරඟයේ ස්වභාවය හඳුනා ගැනීම

වර්තමාන වෙළඳපලේ තරඟය අනිවාර්ය අංගයකි. කිසියම් අවශ්‍යතාවක් හෝ වුවමනාවක් මත වෙළඳපලට විවිධ භාණ්ඩ හෝ සේවා සපයන පුද්ගලයන් හා ආයතනවල එකතුව තරඟකරුවන් ලෙස සැලකේ. ඒ අනුව එම තරඟකාරී වෙළඳපල පිළිබඳ අවබෝධයකින් තම භාණ්ඩ හා සේවා පාරිභෝගිකයාට රුචි පරිදි නිෂ්පාදනය වැදගත් කරුණකි. ඒ සඳහා සමාජ මාධ්‍ය ඔස්සේ ඔබේ ව්‍යාපාරය පිළිබඳ සමාජය දැනුවත් කිරීම ඔබට සිදු කළ හැකිය.

### 04 ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද ?

සාමාන්‍යයෙන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මූලික ධනයක් අවශ්‍ය වේ. ප්‍රාග්ධන අවශ්‍යතාව ව්‍යාපාරයේ ස්වභාවය අනුව වෙනස් වේ. කුඩා පරිමාණ ඇතැම් ව්‍යාපාර අඩු ප්‍රාග්ධනයකින් ආරම්භ කිරීමට හැකියාව පවතී. ඇතැම් ව්‍යාපාර සඳහා යම් ප්‍රමාණයක ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සපයා ගත හැකි මාර්ග

- ස්වකීය ඉතුරුම්
- ස්වකීය වත්කම් යෙදවීම විකිණීම
- බැංකු ණය හා කල් බදු
- නෑදෑ හිතමිතුරන්ගෙන්

මෙම ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය අනුව වාසි අවාසි පවතියි. බැංකු ණයක් ලබා ගැනීමේදී ඇතැම් විටක එමඟින් කොටසක් පමණක් ලබා දෙයි. පොලිය ගෙවීම සිදුකිරීම අනිවාර්ය වේ. මේ පිළිබඳ සැලකිලිමත්ව කටයුතු කිරීම වැදගත්ය.

### 05 ව්‍යාපාරය පිහිටවන ස්ථානය පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය.

ව්‍යාපාරයක් ජනතාව ගැවසෙන ප්‍රදේශයක ආරම්භ කිරීම වැදගත් වේ. අමුද්‍රව්‍ය ලබාගැනීමට පහසු, විදුලිය, ජලය හා සන්නිවේදන පහසුකම් පවතින ස්ථානයක් තෝරාගත යුතුය, පාරිභෝගිකයාට සැපයිය හැකි පහසුකම්,  ශ්‍රමය ලබාගැනීමේ පහසුව පැවතිය යුතුය. මෙවැනි පහසුකම් සහිත ස්ථානයක ව්‍යාපාරයක් ආරම්භ කිරීම ව්‍යාපාර සාර්ථකත්වයට වැදගත් වේ.

ඉහත ආකාරයට ව්‍යාපාරය සාර්ථක කරගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රමවත් ආකාරයට සිදුකිරීමේ දී ව්‍යාපාරය දියුණුවට පත්වනවා පමණක් නොව දිනෙක ඔබගේ වෙළඳ නාමය සන්නාමයක් වනු නිසැකය.


■ සටහන -
**එච්.ඩී.සඳුනි වාසනා**
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

# ප්‍රේක්ෂක ආදරය මම දකින්නේ ආශිර්වාදයක් විදිහට

Hashan Rathnayake

**ශ්‍රී ලාංකීය නූතන සිනමාවේ ප්‍රතිභාන්විත සිනමා නිර්මාණයක් වූ කදිර දිව්‍යරාජ චිත්‍රපටයේ ගණ දෙවියන් ලෙසින් සිනමා රංගනයෙන් මේ දිනවල ප්‍රේක්ෂක ආදරය අසීමිත ලෙස ලබන, රංගන ක්ෂේත්‍රය තුළ තාරුණ්‍යයේ ජනප්‍රිය තරුවක් වන හෂාන් රත්නායක මෙවර ලංකාවේ ජනප්‍රිය ඩිජිටල් සඟරාව වන පවුර ඩිජිටල් සඟරාව සමඟින්.....**

### 01. හෂාන් ඔබ ගැන විස්තර ටිකක් කියමු ?

මම ඉපදුනේ මාතර, පොඩි කාලේ ඉදලා ගමේ හැදුණු වැඩුණු කෙනෙක්. ඉන්පසුව මම කොළඹ පරිසරය තුළ ඉගෙනීමේ වැඩ කටයුතු කරගෙන යනවා පාසල් තුනක. මම අධ්‍යාපන හදාරලා තියෙනවා දික්වැල්ල කුමාරතුංග මධ්‍ය මහා විද්‍යාලය, එම්.ඩී.එච් කනිෂ්ඨ විද්‍යාලය සහ අවසානයට මහරගම ජනාධිපති විද්‍යාලය. පසුව තමයි මම කැලණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණය අධ්‍යයන අංශයේ මානව සම්පත් පිළිබඳ විශේෂ උපාධිය හදාරන්න තේරී පත් වෙන්නේ. ඒ විදියට අධ්‍යාපන කටයුතු කරගෙන යද්දී තමයි මට කලාවට සම්බන්ධ වෙන්න කැමැත්තක් ඇති වෙන්නේ.

### 02. රංගන ක්ෂේත්‍රය තුළ ඔබේ මූලික අඩිතාලම ගැන පැවසුවොත් ?

මම මුලින්ම නිරූපණ ක්ෂේත්‍රයට තමයි එන්නේ, එහෙදි විවිධ ගුරුවරු හරහා නිරූපණය හදාරන්න මට අවස්ථාව ලැබිලා තියෙනවා. ප්‍රථමයෙන්ම මට කැලණිය විශ්වවිද්‍යාලයේ අලෙවිකරණ අංශය මඟින් සංවිධානය කළ Stylish Marketer 2015 කියන නිරූපණ තරඟාවලිය හරහා තමයි නිරූපණයට අඩිය තියන්න මුල්ම අවස්ථාව ලැබෙන්නේ. ඉන්පසුව හිරු අවුරුදු කුමරා 2018 සහ සිරස අවුරුදු කුමරා 2019 යන තරඟාවලි වලට සම්බන්ධ වෙලා ලබා ගත් ජයග්‍රහණත් සමඟ ක්ෂේත්‍රයට එන්න අත්දැකීම් ලබා ගන්න අවස්ථාවන් ලැබෙනවා. ඒ වගේම තායිලන්ඩ් වල පැවැති Mister United Asia 2018 ජාත්‍යන්තර තරඟාවලියට ලංකාව නියෝජනය කරන්නත් එයින් ජයග්‍රහණ රැසැක් ලබා ගන්නත් අවස්ථාව ලැබෙනවා. ඉන්පසුව ඉන්දියාවේ පැවැති Face of South Asia Model festival සඳහා 2019 වසරේදී සහභාගි වීමටද මට අවස්ථාව ලැබෙනවා. ඉතින් මේ විදියට නිරූපණ ක්ෂේත්‍රයේ යද්දි තමයි මට රංගන ක්ෂේත්‍රයට එන්න පුලුවන් වෙන්නේ. මගේ පළමු ටෙලිනාට්‍ය වෙන්නේ TV දෙරණ නාලිකාවේ විකාශය වූ ධරණි ටෙලිනාට්‍ය ඒ හරහා තමයි දේවින්දගේ චරිතය වෙනුවෙන් ප්‍රේක්ෂක ආදරය ලැබෙන පටන් ගන්නේ.






### 03. කදිර දිව්‍යරාජ සිනමා නිර්මාණය ඔස්සේ ගණ දෙවියන්ගේ චරිතය හරහා ඔබට ලැබෙන ප්‍රතිචාර කොහොමද?

ඔව් මේ දිනවල බොහෝ දෙනා ආදරය කරන සිනමාපටයක් තමයි "කදිර දිව්‍යරාජ". මෙය අධ්‍යක්ෂණය කරනු ලැබුවේ සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින්, නිශ්පාදනය ආචාර්ය රවී ලියන්ගේ මහතා විසින්. මෙහි කතරගම දෙවියන්ගේ සහ වල්ලී මාතාවගේ ප්‍රේම කතාව මූලික කරගෙන නිර්මාණය වූ සිනමාපටයක්. බොහෝ දෙනා දෙවියන්ට ආදරය කරන නිසාම මේ වන විට සිනමා ශාලා පිරී යන අතර හොඳ ප්‍රේක්ශක ප්‍රතිචාර ලැබෙමින් පවතිනවා. ඒ අතර ඉතින් ක්ෂේත්‍රයේ සිටින දැවැන්තයින් සමඟ කතරගම දෙවිඳුගේ සොහොයුරා වන ගණ දෙවිඳුගේ චරිතයට මටද සම්බන්ධ වීමට ලැබීම මම ලද වාසනාවක් කියලා හිතනවා. මම කුඩා කල සිටම ගණ දෙවියන්ට ආදරය කරන කෙනෙක් ඉතින් පළමු සිනමා නිර්මාණයෙන්ම මට ඒ වගේ චරිතයක් හරහා සිනමාවට ප්‍රවිශ්ඨ වෙන්න මම හීනකින්වත් හිතලා තිබුණේ නෑ. ටෙලිනාට්‍ය හරහා ප්‍රේක්ෂකයා මා දැක තිබුණත් සිනමාව හරහා මුල්ම අඩිය මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් අධ්‍යක්ෂණය කරනු ලැබූ "කදිර දිව්‍යරාජ" හරහා තැබීමට අවස්ථාව ලැබීම මගේ ජීවිතේ හොඳම අවස්ථාවක් විදියටයි මම හිතන්නේ. කතරගම දෙවියන්ට වගේම ගණ දෙවියන්ටත් බොහොමයක් බැතිමතුන් ලෝකය පුරා සිටිනවා ඉතින් එහෙම චරිතයක් හරහා සිනමාවේ







පළමු අත්දැකීම ලැබූ මට මේ වන විට සිනමාපටය නැරඹූ පිරිසගෙන් බොහෝ ආදරයක් ලැබෙනවා. මේ සිනමාපටයේ කතරගම දෙවියන්ගේ සහෝදරයා තමයි ගණ දෙවිඳුන්. ඉතින් සිනමාපටය නරඹන ප්‍රේක්ෂකයාට ඉතිහාසයේ කියවී තිබෙන සියලුම දේ අපූරුවට මෙම නිර්මාණය තුළ ගොනු කරලා තිබෙනවා.
කතරගම දෙවියන්ගේ සහෝදරයා වන ගණ දෙවියන්ගේ චරිතයට මා තෝරාපත් කර ගන්නේ විමල් දේශප්‍රිය මහතා විසින්. ඔහුට බොහොමත්ම ස්තූතියි මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වගේම ආදරණීය මොවින්දු මල්ලි සහ ආකාශ් මල්ලිත් ආදරයෙන් මතක් කරනවා මේ දෙදෙනාම මගේ පළමු වන සිනමා නිර්මාණයේදී ලොකු ශක්තියක් වුණ දෙදෙනෙක්. ක්ෂේත්‍රයේ දැවැන්තයින් සමඟ මෙවැනි සිනමා නිර්මාණයක් හරහා සිනමාවට ප්‍රවිශ්ට වීමට ලැබීමම මට ලොකු අවස්ථාවක්.

**04. ක්ෂේත්‍රය තුළ ඔබ මුහුණ දී ඇති බාධක, අභියෝග සහ ඔබ ඒ දේවල් වලට මුහුණ දෙන්නේ කෙසේද ?**

මම බාධක සහ අභියෝග වලට ජීවිතේ ගොඩාක් මුහුණ දුන්න කෙනෙක්.
ඒ දේවල් තමයි මට හිත ශක්තිමත් කරන් ජීවිතයට මුහුණ දෙන්න පුරුදු කලේ. ගොඩාක් වෙලාවට මගේ ජීවිතේ මඟ පෙන්වන්නා මමම තමයි. පොඩිම කාලේ ඉදලා මගේ ජීවිතයේ දුක කියන දේ හොඳට අත් විඳපු කෙනෙක් ඒ දේවල් එක්ක මම ජීවිතේ මම ආස කරන හීන වලට හෙමින් තමයි ගමනක් යන්නේ. ඉතින් විශ්වවිද්‍යාල ජීවිතය තුළින් මට ලොකු ආත්ම ශක්තියක් ගොඩනැඟුනා. මම පෞද්ගලිකව විශ්වාස කරනවා ජීවිතේ තේරුම් ගන්න සහ තමාටම ජීවිතය පිළිබඳව ආත්ම ශක්තියක් ගොඩනඟා ගන්න අභියෝග, බාධක සහ දුක කියන දේවල් ජීවිතයට ලැබෙන්න ඕන. ඒ හරහා ඉදිරියට යන්න වගේම තමන්ගේ ආත්මය සතුටු කරන්න අපිට හැකියාවක් ලැබෙනවා. ක්ෂේත්‍රයට එන මුල්ම කාලේ සිටම විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ අවස්ථා තිබුණා. නමුත් මම මගේ ජීවිතය තුළ මට හමුවන සෑම බාධකයක්ම, අභියෝගයක්ම මගේ ජීවිතේ ශක්තියක් කර ගනිමින් මම ඉදිරියට යනවා.

**05. හෂාන් ඔබේ ප්‍රථම ටෙලි නාට්‍ය ධරණී පිළිබඳ මතකය ආවර්ජනය කළොත් ?**

**දේවින්දගේ චරිතයෙන් ප්‍රේක්ෂකයා අතරට ගිය මගේ පළමුවන ටෙලිනාට්‍ය TV දෙරණ නාලිකාවේ විකාශය වූ "ධරණී ". එය ශ්‍රියන්ත ප්‍රසාද් රත්නායක විසින් අධ්‍යක්ෂණය කළ අතර නිදුක් මධුශික විසින් පිටපත් රචනය කළ නිර්මාණයක්. මේ හරහා තමයි ප්‍රේක්ෂකයා මුල්ම වරට මා හඳුනා ගන්නේ ඒ හරහා හැම දෙනාගේම ආදරය ලබන්න අවස්ථාව මට ලැබෙනවා. අදටත් මට නොඅඩුව ප්‍රේක්ෂක ආදරය ඒ නිර්මාණය නිසාවෙන් ලැබෙනවා. නිදුක් අයියා තමයි මෙහි දේවින්දගේ චරිතය වෙනුවෙන් මා නිර්දේශ කරනු ලබුවේ, ඒ වෙනුවෙන් මා තෝරාපත් කර ගත් ශ්‍රියන්ත අයියා, නිදුක් අයියාට ගෞරවයෙන් මා ස්තූතිවන්ත වන අතර දෙරණ නාලිකාවටත් ස්තූතිය පුද කළ යුතුයි.**

**06. මේ දිනවල ස්වර්ණවාහිනී නාලිකාව ඔස්සේ විකාශය වන සුසුම් රස්තියාදුව ටෙලි නාට්‍ය පිළිබඳ යමක් කියමු ?**

**සම්මානිත ප්‍රියන්ත ප්‍රනාන්දු මහතාගේ අධ්‍යක්ෂණයක් සහ අරුණ ප්‍රේමරත්නයන් විසින් රූපවාහිනියට රචනය කළ නිර්මාණයක් වන "සුසුම් රස්තියාදුව" මේ දිනවල ස්වර්ණවාහිනී නාලිකාවේ විකාශය වෙනවා, රකිතගේ චරිතයෙන් රංගන දායකත්වය ලබා දෙන මාගේ තෙවන ටෙලිනාට්‍ය. ක්ෂේත්‍රයේ ඉන්න දැවැන්තයින් සමඟ මෙවැනි නිර්මාණයකට මගේ දායකත්වය ලබා දීමට හැකි වීම වටිනා අවස්ථාවක් විදියට මම දකිනවා. විශේෂයෙන් මෙවැනි අධ්‍යක්ෂකවරයෙකුගේ සහ පිටපත් රචකයෙකුගේ නිර්මාණයකට දායකත්වය ලබා දීමට හැකිවීම රංගන ක්ෂේත්‍රයේ එක් වටිනා සංධිස්ථානයක් විදියට මම විශ්වාස කරන අතර මේ සඳහා මා තෝරාපත් කරගෙන මඟපෙන්වීමක් ලබා**

දෙමින් නිර්මාණයට දායක කර ගත් අධ්‍යක්ෂ ප්‍රියන්ත ප්‍රනාන්දු මහතාට මා ස්තූතිවන්ත වෙනවා.

**07. ඔබේ ප්‍රේක්ෂකයන් වෙනුවෙන් යමක් පැවසුවොත් ?**

මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වූ දවසේ ඉදලා මම හරි ආසයි ප්‍රේක්ෂකයාගේ ආදරය ලබන්න, ප්‍රේක්ෂක ආදරය මම දකින්නේ ආශිර්වාදයක් විදියට මගේ පළමු නිර්මාණය වන "ධරණී" ටෙලිනාට්‍ය හරහා අදටත් වයස් භේදයකින් තොරව ආදරය ලබන්න මම වාසනාවන්තයි. විශේෂයෙන් පොඩි අයගෙන් ආදරය මට ගොඩාක් ලැබෙනවා. ඔවුන් සමඟ කතා බහ කරද්දී පවා කියවෙන සමහර වචන හරිම ආදරණීයයි සහ හදවතට ගොඩාක් දැනෙනවා. මේ හැමෝගෙම ආදරයට මම ගොඩාක් ආදරෙයි සහ මම නිතරම ඔවුන්ට ගෞරව කරනවා. ඉතින් ඒ ආදරය මගේ ඉදිරි ගමනට ආශිර්වාදක් වෙයි කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා.

**08. ඉදිරියට ඔබ සම්බන්ධ වන ඔබේ අලුත් නිර්මාණයන් මොනවාද ?**

මේ වන විට මගේ දායකත්වය ලබා දුන් ටෙලිනාට්‍ය කිහිපයක්ම විකාශය වීමට නියමිතව තිබෙනවා. ඉදිරියේදී ඒ නිර්මාණත් ප්‍රේක්ෂකයාට බලා ගන්න පුලුවන් වෙයි. ඒ වගේම තවත් නිර්මාණ කිහිපයකටම ආරාධනා ලැබිලා තිබෙනවා. මගේ උපරිම දායකත්වය ලබා දීමට හැකි චරිත සහිත නිර්මාණ වෙනුවෙන් කැපවීමෙන් දායකත්වය ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

**09. පවුර ඩිජිටල් සඟරාව සමඟ කතාබහට එක්වීම ගැන ඔබේ අදහස කුමක්ද ?**

ඇත්තටම ගොඩක් හොඳ සඟරාවක්, අපට ආදරය කරන ප්‍රේක්ෂකයාට පහසුවෙන් තොරතුරු බෙදා ගන්න පුලුවන් සඟරාවක් විදියට මම දකිනවා. මා සම්බන්ධ කර ගත් ඔබටත් ඔබේ කණ්ඩායමටත් බොහොමත්ම ස්තූතියි!

- කතාබහා -

**සෙව්වන්දි ඉමාෂා මුණසිංහ**
හ/දෙබරවැව ජාතික පාසල



# ජීවිතයට අලුත් විලාසිතාවක් "සකසුරුවම"

පුද්ගලයා අවිවේකීය. විඩාව ජීවිතයේ කොටසක්ය. කාර්යබහුල ජීවිතයට මිනිසා ගොදුරු වී හමාරය. ජීවිතය නමැති දුවන තරඟය අතරමඟ මොහොතක් නැවතී සිතන්න. තමාගේ ජීවන ගමන නැමැති තරඟය ආරම්භ කළ මාවත දෙස හැරී බලන විට තමා වෙනුවෙන් සකසුරුවම් කරගත යුත්තක් තිබීම අත්‍යවශ්‍ය නොවේද? නැතහොත් ජීවිත රේස්එක දුව ආ මාවත දෙස හැරී බලන විට තමාටම කියා කරගත් දෙයක් නැතිනම් පුද්ගලයාට තමා ගැනම සිතෙන්නේ පසුතැවීමත් සමඟ මහන්සියක් නොවේද? ඔබ සිතිය යුත්තේ අද ගැන පමණද? ඇයි ඔබට හෙටක් නැද්ද? හෙටට ඔබ අද ආයෝජනය කළ යුතුයි. එසේනම් සකසුරුවම නැතහොත් රැස් කිරීම එකතු කිරීම ජීවිතයේ කොටසක් කරගත යුතුමය.

1924 ඔක්තෝබර් 31 වෙනි දින ලෝක ඉතිරි කිරීමේ බැංකු සංගමය සංවිධානය කළ ජාත්‍යන්තර ඉතුරු කිරීමේ සමුළුවේදී මෙම දිනය පළමුවරට ප්‍රකාශයට පත්කරන ලදී. ලෝකයේ ධනවත් රටවල් මෙන්ම දුප්පත් රටවල් ද ඇත. ඒ කුමන රටකට වුවද ඉතිරි කිරීම වැදගත්ය. එයට හේතුව එමඟින් රටේ පුද්ගලයාගේ අනාගතය තීරණය කරන බැවිනි. රටක සංවර්ධනයට මෙන්ම පුද්ගලයාගේ සංවර්ධනයට ද සකසුරුවම ඉතා වැදගත්ය. සකසුරුවමට පුද්ගලයා හුරුවිය යුත්තේ කුඩා කල සිටමය. කුඩා කල මනසේ තැන්පත් කරන සකසුරුවම ජීවිතය විලාසිතාවක් බවට නිරුත්සාහයෙන්ම පත් කරගනියි. සකසුරුවම් කළ යුත්තේ මුදල් පමණම ද? නැත. නමුත් බොහෝ පිරිසක් සිතනුයේ ඉතිරි කිරීමට හැකියාව ඇත්තේ මුදල් පමණක්ම කියාය. තමාට වටිනා යැයි හැඟෙන සියල්ල සකසුරුවම් කළ හැකිය. තමාගේ මුදල්, කාලය,ජීවිතය ආහාර සිතුවිලි මේ සියල්ල තමාට ඉදිරි අනාගතය සඳහා සකසුරුවම් කරගත හැකිය.

ඕනෑම දෙයක දෙපැත්තක් තිබේ. අය සහ වැය. උපයන දෙයින් කිසිඳු ඵලප්‍රයෝජනයක් නොගෙන තමා කැමති දෙයකට වියදම් නොකර ලෝභී ජීවිතයක් ගත කිරීම සකසුරුවම ලෙස අදහස් නොවේ.ඒ පිළිබඳව විවිධ ආගම් දර්ශන මඟින් ද අවධාරණය කර ඇත. බුදු දහමේ එන එවැන්නක් නම් උපයන දෙය කොටස් හතරකට බෙදීමය. එයින් දෙකොටසක් ආයෝජනයටත් තවත් කොටසක් පරිභෝජනය පිණිසත්ය. පරිභෝජනය කළ යුත්තේ එක් කොටසකි. එපමණටම සැනසිල්ලක් ඇති කරන බව බුදු දහමේ පවසයි.

අනෙක් ආගම් දර්ශන මඟින් ද මිනිසාට ඉතුරු කිරීමේ වැදගත්කම මතු කරයි. ඛේදවාචකය නම් තරුණ පරම්පරාවට තමන් වෙනුවෙන් දෙයක් ඉතිරි කරගැනීමට හැඟීමක් නොමැති තරම්ය. ඔවුන් හෙටක් ගැන සිතන්නේ නැතිව හැකි උපරිමයෙන් වියදම් කරයි. නොදකින අනාගතය දෙස නොබලා හෙට දවසට වඩා අද දවස සතුටින් ගත කළ යුතු යැයි මතයක් තරුණ තරුණියන්ගේ සිත් තුළ නිර්මාණය කරගෙන තිබේ. මෙය බහු ජාතික සමාගම් ලාභ ලැබීමේ අරමුණින් සමාජ මාධ්‍ය උපයෝගී කරගනිමින් තරුණ තරුණියන් වෙත ගෙන ගොස් තිබෙන ෆැන්ටසිකාමී මතයකි. තරුණ ප්‍රජාව එහි ඉත්තන් වී ඇත්තේ ඔවුන්ටවත් නොදැනීමය. අවශ්‍ය භාණ්ඩ මෙන්ම අනවශ්‍ය භාණ්ඩ මිලදී ගන්නේද සුද්දන් මෙනි. තවත් කෙනෙකු පාවිච්චි කරන නිසා තමන්ට එයින් මදිපුංචිකමක් වේ යැයි සිතමින් නිකරුණේ වියදම් කරන තරුණ තරුණියන් කොපමණ සිටිනවාද? වැටුප ගන්නේ කවදාදැයි ඔවුන් ඇඟිලි ගැන ගැන බලන් ඉන්න අතර එය වියදම් කරන ආකාරය පිළිබඳවත් කල්පනා කරන්නේ නොඉවසිල්ලෙනි. එය ඉතිරි කරගන්නේ කොයි ආකාරයකට දැයි සිතන්නේ නැත. එත් සමඟම අමතරව වියදම් ද සිතට නැගෙන්නේ නොසිතූ වේගයෙනි.

තරුණ තරුණියන් ආකර්ෂණය කරගන්නට එක් එක් ආකාරයේ කෑම කඩ ඕනෑ තරම් සමාජයේ වේගයෙන් ගොඩනැගේ. අත්‍යවශ්‍ය අවශ්‍යතා පසෙකලා වුවමනාවලට මුල්තැනක් දීම තරුණ තරුණියන්ගේ පුරුද්දක් බවට පත්වී ඇත. නමුත් ඔවුන් ඉතිරි කරගන්නට තියා අවශ්‍යතාවත් නිසි ආකාරයට පරිපූර්ණ කරගන්නේ නැත. සකසුරුවම මිල මුදල් සමඟම බැඳුන්නාක් නොවේ. දිනකට තරුණ තරුණියන් ඇතුළු සියලුම දෙනා මොනතරම් තමාගේ කාලය වැය කරමින් තොරතෝංචියක් නොමැතිව කොතරම් අල්ලාප සල්ලාපයේ යෙදෙනවාද? තමන්ගේ කාලයත් අනුන්ගේ කාලයත් නාස්ති කරගන්නේ අනවශ්‍ය දෙයකට ය. අවශ්‍ය දේ පමණක් කතා කර එය එතනින් නවතා එම කාලය ප්‍රයෝජනවත් කාර්යයක් කිරීමට ඉතිරි කර ගැනීමට අපට හැකියාව පවතිනවා නේද?

සකසුරුවම පුද්ගලයාගේ ජීවිත විලාසිතාවක් වීමට නම් වර්ධනය කළ යුතු අංග දෙකක් තිබේ. අලසකම දුරු කිරීම එක් කරුණකි. අනෙක් කරුණ නම් ජීවිත කළමනාකාරිත්වය. සමහර පුද්ගලයින් කුඩා දුර පවා පා ගමනින් යාමට අලසය. පාන්දරින් නැගිට උදෑසන ආහාර සකස් කිරීමට අලසය. මුදල් යොදවා එම එදිනෙදා කාර්යය සිදුකළේ නැති වුවහොත් ඔවුන් එය මදි පුංචිකමක් ලෙස සලකයි. නමුත් එය දියුණුවන පුද්ගලයකුගේ චරිත ලක්ෂණයක් නොවේ . තමාට හැකි පමණින් තමාගේ ශක්තිය යොදවා තමාගේ ජීවිතය ද මුදල් ද සකසුරුවම් කර ගැනීමට සියලු දෙනා සිතට ගත යුතුයි.

කළමනාකරණයද සකසුරුවමේ වැදගත් අංගයකි. තමන්ගේ කාලය, මුදල, ආහාර ,ඇඳුම් පැළඳුම් අධ්‍යාපනය, යාන වාහන ආදී ජීවිතේ පැවැත්මට අත්‍යවශ්‍ය අවශ්‍යතා කාලයට අනුව නිසි කළමනාකරණය කර ගැනීමකින් සියල්ල සැලසුම්කර තිබේ නම් පුද්ගලයාට අනාගතය පිළිබඳ බිය වීමට කාරණාවක් නැත. නිතරම වියදම් කරන විට මෙය මා හට අවශ්‍ය දෙයක් දැයි පළමුව සොයා බැලිය යුතුයි. හෙටට මා වෙනුවෙන් කරගත්තේ කුමක් දැයි සිතන්න. සකසුරුම් ජීවිතේ විලාසිතාවක් කර ගැනීම ඔබට හෙටක් ඉතිරිවන විලාසිතාවකි.

■ සටහන -
**සත්‍යාංජලී ජයසිංහ**
කැලණිය විශ්වවිද්‍යාලය

# තරුණ කාලයෙන් ඔබ උපරිම ප්‍රයෝජන ගන්නවද



තාරුණ්‍යය රටක ජවයයි. එරට ඉදිරි ගමනට ශක්තියකි. මිනිසුන්ගේ තරුණ අවධිය වැඩියෙන් වැඩ කළ හැකි කාලයක් වේ. ඒ කායික හා මානසික සුවයෙන් පිරිපුන් කාලයක් බැවිනි. නමුත් ඒ තරුණ කාලය ප්‍රයෝජනවත් වැඩකට නොයෙදීම විශාල වැරැද්දකි. මෙරට නගරවල වගේම ග්‍රාමීය ප්‍රදේශ තුළ ද තරුණයන් කල්ලි ගැසී සිටී. ඔවුන් සෑම දිනකම සුපුරුදු චර්යාවක යෙදී සිටිති. වීදිවල නැතිනම් බස් හෝල්ට් වල සැරි සැරීම ඔවුන්ගේ එකම රාජකාරියයි. ජීවිතේ හොඳම කාලයෙන්  ප්‍රයෝජනයක් නොගෙන දෙමාපියන්ගෙන් යැපෙමින් ඔවුන් ජීවත් වෙති.

මෙසේ තරුණයෝ කල්ලි ගැසී සිටීමෙන් මත්ද්‍රව්‍ය සඳහා ද ඇබ්බැහි වී සිටිති. එමගින් තාරුණ්‍යය වගේම ඉතිරි කාලයත් විනාශ වී යයි. මෙය රටක ඉදිරි ගමනට අහිතකර බලපෑමකි. රටක් දියුණු වීමට නම් එරට තාරුණ්‍යයේ නොමඳ සහයෝගය ලැබිය යුතුමය.

අපේ වැඩිහිටියන් ඔවුන්ගේ තරුණ කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන ඇත. ගොවිතැන් කරමින් සෙසු වැඩවල ද යෙදෙමින් ස්වයංපෝෂිත ආර්ථිකයක් මෙරට ඇති කරන ලදී. වර්තමානයේ ඊට හාත්පසින්ම වෙනස් ය. තරුණ තරුණියන් ඔවුන්ට තිබෙන ශක්තිය පිළිබඳ අවබෝධයක් නැත. ඒ නිසා නිකරුණේ කාලය ගෙවා දමයි.

විවාහයකදී දෙමාපිය සරණ නැතිවන විට ඔවුන් ගෙවූ ජීවිතය පිළිබඳ පසුතැවේ. ඒ නිසා තරුණ කාලයෙහි වෙහෙස වී අනාගතය උදෙසා වැඩ කිරීම තම යහපතටම හේතු වේ. රටේ තාරුණ්‍යය නිසි මඟට ගැනීම මෙරට ඇති වී ඇති බොහෝ ප්‍රශ්නවලට විසදුමක් ද වේ.

■ සටහන -
**සුදර්ශනි කෝණාර**
කැළණිය විශ්වවිද්‍යාලය

# ආදරණීයන්ගේ වැලන්ටයින්

පෙබරවාරි 14 කියූ සැනින් ඔබට, මට මතක් වන්නේ ඒ ආදරණීය දිනයයි. එනම් 'වැලන්ටයින් දිනය' නොහොත් 'ආදරවන්තයින්ගේ දිනයයි.' ඒ දිනයට තම ප්‍රේමවන්තයාට හෝ ප්‍රේමවන්තියට පුංචිම හෝ තෑග්ගක් ලබා දී ඔවුන් සතුටු කිරීමට ප්‍රේමණීය හදවත් ඇති ආදරණීයන් කටයුතු කරයි.
මේ ආදරවන්තයින්ගේ දිනය ඔබ සැමරුවත්, ඒ පිටුපස සැඟවුණු අප්‍රසිද්ධ කාරණාවන් කිහිපයක් තිබෙන බව ඔබ දන්නවාද? මේ ඒ පිළිබඳවයි.

**01. සරු බව පැතීමේ උත්සවය**

වැලන්ටයින් දිනයේ ආරම්භය සිදුවී ඇත්තේ පුරාතන රෝම 'සරු බව පැතීමේ උත්සවයකින්' ය. එකළ රෝමයේ සමහරු සෑම වසරකම පෙබරවාරි මස 13 ත් 15 ත් අතර 'ලූපර්කැලියා' නම් උත්සවයක් සංවිධානය කළ අතර, එහිදී කාන්තාවන්ගේ සරු බව දෙවියන්ගෙන් පැතීම සිදුවිය. නමුත් එය වර්තමාන වැලන්ටයින් දිනය මෙන් සුන්දර එකක් නොවීය. මෙහිදී දෙවියන්ට සත්ත්වයින් කැපකිරීම උදෙසා බිලිදීම සිදුවූ අතර, ඔවුන්ගේ ලොම් ගෙන ඒවායින් කාන්තාවන්ට පහර දීම හරහා ඔවුන්ගේ සරුභාවය වැඩිදියුණු වෙතැයි ඔවුන් විශ්වාස කරන ලදී.

**02. මල්සරා යනුවෙන් හඳුන්වන ග්‍රීක දේවතාව**

වැලන්ටයින් දිනය පමණක් නොව, ආදරය සම්බන්ධ කටයුතුවලදී ඒවාට දිරි දෙන අයෙකු වන 'මල්සරා' නම් මනඃකල්පිත චරිතය පිළිබඳව ඔබ කොතෙකුත් අසා ඇත. මෙම මල්සරාගේ මූලාශ්‍රය වන්නේ 'ඊරොස්' නම් ග්‍රීක දේවතාවයි. ක්‍රිස්තු පූර්ව 700 තරම් ඈත කාලයකදී ග්‍රීක වැසියන් අදහපු මෙම දේවතාව තම හීවලින් පෘථග්ජන ජනතාවට විද ඔවුන් අතර ප්‍රේමය ඇති කරන බවට පැරැණි ග්‍රීකයන් අතර පිළිගැනීමක් තිබුණි. මෙම දේවතාවා 'මල්සරා' ලෙස වැලන්ටයින් දිනය හා සම්බන්ධ කොට ලොවට ඉදිරිපත් කරන්නට වූයේ 19 වැනි සියවසේදීය.

**03. කමිස අත්වල හදවත් පැළඳීමේ අතීතය**

වැලන්ටයින් දිනයට සමහර පිරිස් රටවල ආදරවන්තයින් සිය ආදරවන්තයාගේ හෝ ආදරවන්තියගේ නාමය කෙටූ හදවතක් සිය ඇඳුම්වල, අතෙහි හෝ වෙනත් තැනක පැළඳිය. මේ පිටුපස සැඟවුණු කතාව වන්නේ රෝමයේ 'ක්ලෝඩියස් අධිරාජයා' හා බැඳුණු කතාවකි. ඔහු විවාහය නොපිළිගත් අයෙකු වූ අතර, ඒ ඒ වසරවල පුරුෂයන් හා කාන්තාවන් තාවකාලිකව එකට ජෝඩුවීම පමණක් පිළිගත් අයෙක් විය. එකළ පැවති 'ජුනෝ දේවතාවිය' පිදෙන උත්සවයකදී රෝම පුරුෂයන් තමන් ඊළඟට පැමිණෙන වසරක කාලය තුළදී ආශ්‍රය කරන කාන්තාවන්ගෙන් නම් හදවතක් ආකාරයෙන් තැනූ කුඩා පලකයක කොටා සිය කමිස අතේ පැළඳිය යුතු විය. ඒ ආකාරයට ඒවා පැළඳගෙන සිටින යුවළ වලට වසරක කාලයක් යනතුරු කිසිවෙක් බලපෑම් එල්ල කරන්නේ ද නැත.

**04. වැලන්ටයින් දින මල් දීම ඇරඹූ වික්ටෝරියානුවෝ**

'රතු රෝස' ආදරයේ සංකේතයක් ලෙස පුරාතන රෝම වැසියන් සැලකීය. මෙය ඊරොස් හෙවත් මල්සරාගේ මව ලෙස සැලකූ වීනස් දෙව්දුවට වඩාත් බහුලවම පිදූ මල් වර්ගය විය. ඒ අනුව වික්ටෝරියානු යුගයේදී පුරුෂයන් විසින් තමන් ආදරය කරන කාන්තාවට මල් ලබාදීම ආරම්භ වූ අතර, අදටත් වැලන්ටයින් දිනයේ දී වැඩිපුරම අලෙවි වන මල් වර්ගය වන්නේ රෝස මලයි.

**05. වැලන්ටයින් දින චොකලට්**


වැලන්ටයින් දිනයේදී බොහෝ දෙනා තම ආදරවන්තයාට හෝ ආදරවන්තියට චොකලට් ලබාදීමට අමතක නොකරන අතර මේ පුරුද්ද ආරම්භ වූයේ 'රිචඩ් කැඩ්බරි' නම් චොකලට් වෙළෙන්දා විසින්ය. ඔහු වැලන්ටයින් දිනය ඉලක්ක කරගෙන හදවත් හැඩයට සැකසූ චොකලට් 1860 දශකයේදී වෙළඳපොළට නිකුත් කරන්නට වූ අතර ඒවා උණු කැවුම් මෙන් අලෙවි වන්නට ද විය. එලෙසින් වැලන්ටයින් දිනයට තමන් ආදරය කරන පුද්ගලයාට චොකලට් ලබාදීම අද වන විටත් ආදරවන්තයින් අතර තිබෙන්නා වූ පුරුද්දක් වන අතර එම දිනයේදී වැඩිමනක් අළෙවි වන රස කැවිල්ල වන්නේද චොකලට් වෙයි.

මෙයාකාරයට ආදරවන්තයින්ගේ දිනයේ සැබෑ අරුත පිළිබඳව ඔබට යම් ආකාරයක වැටහීමක් ලබා ගත හැකි වනවා මෙන් ම වැලන්ටයින් දිනයට පමණක්ම විශේෂ කොටගෙන තමන් ආදරය කරන පුද්ගලයාව අගය නොකර, තමන් ආදරය කරන්නට පටන් ගත් දිනයේ සිට එය අවසන් වන දිනය දක්වාම එක ලෙසට ඔහුටත්, ඇයටත් ආදරය කරන්නට පුරුදු වන්න. එවිට ඔබටම වැටහේවි, 'හැම දිනයක්ම වැලන්ටයින් දිනයක්' බව.


■ සටහන -
**ඉසුරි එදිරිසිංහ**
කැලණිය විශ්වවිද්‍යාලය

නව්‍යකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කලාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine

www.pawura.lk



ISSUE 25 — JAN 14, 2024
ISSUE 24 — Dec 31, 2023
ISSUE 23 — Dec 24, 2023
ISSUE 22 — Oct 15, 2023
ISSUE 21 — Sep 15, 2023
ISSUE 20 — Aug 15, 2023
ISSUE 19 — July 16, 2023
ISSUE 18 — July 03 2023
ISSUE 17 — June 15, 2023
ISSUE 16 — June 03, 2023
ISSUE 15 — May 30, 2023
ISSUE 14 — May 16, 2023
ISSUE 13 — April 17, 2023
ISSUE 12 — March 15, 2023
ISSUE 11 — February 15, 2023
ISSUE 10 — January 21, 2023
ISSUE 09 — December 2, 2022
ISSUE 08 — October 14, 2022
ISSUE 07 — August 22, 2022
ISSUE 06 — August 16, 2022
ISSUE 05 — June 24, 2022
ISSUE 04 — May 16, 2022
ISSUE 03 — April 10, 2022
ISSUE 02 — March 02, 2022
ISSUE 01 — Feb 2, 2022

# කොළඹින් ගෙදරට
## හදවතින් පණිවිඩයක්

සීත සුළඟක් කවුලු පියන් දොරකින් එබේ
ඈත අහසක සොඳුරු වලාවන් නෙක තිබේ
මාන බලනා කොක්කු නිවහනට පිටවුනේ
රෑක මම යහන මත මතකයක තනිවුනේ

ගිමන් හරිමින් වෙහෙස කර දවස ගෙවෙනවා
සිත කොනක නොකියු එක කතාවක් තියෙනවා
නෙතු අතර මැවී මැවී රුවක් මං දකිනවා
සත්තකින් මම හෙටම මගෙ ගෙදර දුවනවා

කාශ්ටක මහ පොළව වියරු ලෙස බලන්නෙ
හැම දිනක හිස රිදුම් නෙතුයි යලි අඬන්නෙ
නෑයො කවුරුත්නැතුව තනිකමයි තියෙන්නෙ
විඩාබර හැම රැයක් කොහොම මම ගෙවන්නේ

රසබොජුන් දිව නහර නැහැනේ දැන් පිනන්නේ
නාස්පුඩු හිර වෙන්න සුවඳ නැහැ තියෙන්නේ
කට සැරට සම්බලේ නැහැනෙ මෙහෙ උයන්නෙ
ගාන නම් හරි සැරයි බත් ටිකයි ලැබෙන්නේ

උයාගෙන කන්න නම් වෙලා මදි වෙයි දිනෙක
විගහටම නැගිටිනවා අම්මේ වෙහෙසයි හරිම
අසයිමන්ට් නෝට් ගොඩ ඔලුව අවුලයි නිතර
අම්මෙ මට අද හෙටම එන්න හිතෙනවා ගෙදර

තබම් පියවර නිතර ඔබ ගැනම හිත හිතා
ඔය දෙන්නාගේ හීන ඉටු කරමි මම හිතා
දුක් දෙන්නේ නෑ දිනක සත්තමයි ඔබේ පුතා
දිනක ජය ගම් ලොවම ඔටුනු පළඳමි එදා

රෑ බෝවෙලා හදින් වැලපෙන්නෙ නැහැ ඉතින්
දුක් ගින්න ඉවසන්න තව ටිකයි සෙනෙහසින්
විවේකිව ඔබ ඉන්න දිනක අපේ නිවහනින්
රැකගනිමි ඉගෙන ගෙන ලොකු කෙනෙක් වී හොඳින් ...

- **ඩිනූ සල්ගමුවගේ**


## මෙවර කලාපයේ කතුවරුන්

- ප්‍රබුද්ධිකා හේරත්
- ඩබ්ලිව්.නිලුක්ෂි කුමාරි
- නිරෝෂා සදමාලි
- එච්.එම්. දිල්හාරා බණ්ඩාර
- එස්. රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්
- වින්ද්‍යා රත්නායක
- එච්.ඩී.සඳුනි වාසනා
- සෙව්වන්දි ඉමාෂා මුණසිංහ
- සත්‍යාංජලී ජයසිංහ
- සුදර්ශනි කෝණාර
- ඉසුරි එදිරිසිංහ

## නිසදැස්

- ඩිනූ සල්ගමුවගේ
- ප්‍රබුද්ධිකා හේරත් ( පබා )
- පී.ඩී.මල්ෂා සම්මානි
- සචී
- එම්.පී තාරිකා මධුශානි

## වෙබ් සංස්කරණය

- චතුර කවිඳු

## සංස්කරණය

- තුෂාන් බණ්ඩාර
- හිමාෂා රණතුංග
- සුලෝචනා නදීෂානි
- පබසරා ගීවින්දි

## අධීක්ෂණය

- ප්‍රියශාන් මදුසංක
- තුෂාන් බණ්ඩාර



All images are copyrighted by their original owners